6865

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 06 | විෂයය / பாடம் / Subject නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper I ,II | කාලය / காலம் / Time පැය 02යි. |

නම:-.............................................................. විභාග අංකයා:-..................................................

උපදෙස්
- පළමු කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 20 දක්වා ප්‍රශ්නවල (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. කතාන්දර කියවීමෙන් නාට්‍ය හා රංග කලාව හදාරන සිසුන්ට ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ මින් කුමක්ද?
(1) දෙබස් උච්චාරණය පහසුවීම. (2) හඬ පාලනයට හැකිවීම.
(3) චරිත හඳුනාගැනීමට හැකිවීම. (4) ඕනෑම අවස්ථාවක් රඟපෑමට හැකිවීම.

02. සතුන් හා මිනිසුන් අනුකරණය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ මින් කුමක් ද?
(1) සතුන්ට හා මිනිසුන්ට ආදරය කිරීමට කැමැත්ත ඇතිවීම.
(2) අන් අයට උසුළු විසුළු කිරීමට අවස්ථාවක් සැලසීම.
(3) ස්වභාව සෞන්දර්ය රස විඳීමට හැකිවීම.
(4) රංගනයේ දී ඒ ආකාරයෙන්ම රඟපෑමට හැකිවීම.

03. රංගනයට දායක කරගත හැකි එදිනෙදා ජීවිතයේ දී අපට හමුවන චරිතයකි.
(1) වෛද්‍යවරයා (2) බස්කොන්දොස්තරවරයා
(3) මන්ත්‍රී ආරක්ෂකයා (4) ජනාධිපතිවරයා

04. "අහස කඩා වැටීම" කතාන්දරයේ ප්‍රධාන චරිතය වන්නේ,
(1) හාවා (2) ගෝන්නු (3) මුවා (4) කුළු හරක්

05. නාට්‍ය හා රංග කලාව
(1) ශ්‍රව්‍ය කලාවකි. (2) ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවකි.
(3) දෘශ්‍ය කලාවකි. (4) මුද්‍රිත කලාවකි.

06. නාට්‍යයක් ප්‍රේක්ෂකයන් වෙත ඉදිරිපත් කරන මාධ්‍යය වන්නේ,

(1) ගීතයයි. (2) නර්තනයයි. (3) අභිනයයි. (4) පසුතලයයි.

07. සාමාන්‍යයෙන් අප දකින නාට්‍ය බෙදා දක්වන කොටස් ගණන

(1) 5කි. (2) 4කි. (3) 3කි. (4) 2කි.

08. චරිතයන්ට අදාළ පරිදි ඉරියව් හා හැඟීම් මුහුණ ප්‍රධාන කොටගෙන ඉදිරිපත් කිරීමට යොදා ගන්නා අභිනය

(1) ආංගික වේ. (2) වාචික වේ. (3) සාත්වික වේ. (4) ආහාර්ය වේ.

09. අධි මානුෂික චරිතයක් නොවන්නේ මින් කුමක් ද?

(1) දෙවියා (2) විදුහල්පතිවරයා (3) යෝධයා (4) රාක්ෂයා

10. පෙර සූදානමකින් තොරව ඉදිරිපත් කරන නිරූපණය

(1) ක්ෂණික නිරූපණය වේ. (2) අභිරූපණය වේ.

(3) නිරූපණය වේ. (4) රූපණය වේ.

11. සරල වෙස් මුහුණක් සැකසීමට යොදා ගත නොහැකි දෙයකි.

(1) පුවක් කොළපත් (2) කදුරු ලී (3) තේක්ක කොළ (4) දියපර කොළ

12. සාමාන්‍ය ආභරණයක් හා රංගාභරණයක් අතර ඇති වෙනස් කමක් වනුයේ,

(1) වර්ණවත් වීම. (2) ප්‍රමාණයෙන් විශාලවීම.

(3) කල්පැවැත්ම. (4) පහසුවෙන් පැළඳිය හැකිවීම.

13. සංවේදන අභ්‍යාසයක් ලෙස ඇවිදීම සඳහා යොදා නොගන්නා දෙයක් ලෙස සැලකිය හැක්කේ,

(1) මඩ (2) තණකොළ (3) ගින්දර (4) දිය සෙවල

14. කටහඬ අනුකරණයට පුහුණු කල හැකි ක්‍රම වේදයක් නොවන්නේ,

(1) මනුෂ්‍ය හඬ අනුකරණය. (2) නාට්‍ය පිටපත් උච්චාරණය.

(3) සත්ව හඬ අනුකරණය. (4) වාහන හඬ අනුකරණය.

15. ස්වභාවික පරිසරයෙන් ඇසෙන ශබ්දයක් නොවන්නේ,

(1) වාහන හඬ (2) වර්ෂාව (3) හෙනහඬ (4) කුරුළු ගී

16. "කොපර කොපර පිපිඤ්ඤා" ගීතය අයත් වන්නේ,

(1) එළුවන් කැමටය. (2) මේවර කෙලියටය. (3) ලේන්සු හැංගීමටය. (4) චක්ගුඩු පැනීමටය.

17. චරිතයක් රඟපාන විට අපට නළුවාගෙන් නොපෙනෙන්නේ

(1) චරිතයට අදාල මුහුණේ ඉරියව්ව. (2) ඔහුගේ භාෂා විලාශයය.

(3) ඔහු ඒ මොහොතේ සිතන දේය. (4) ඔහුගේ චරිත ලක්ෂණය.

18. ජනකතා වර්ගයට අයත් නොවන්නේ

(1) රජකතා (2) ගම කතා (3) ජාතක කතා (4) අන්දරේගේ කතා

19. "තමන් පණ ලෙස හැම - සතුන් ගැන සළකා පෙම" කවිය ඇතුලත් කෘතිය වන්නේ

(1) සුභාෂිතය (2) ධම්ම පදය (3) බුද්ධ ගජ්ජය (4) සිරිත් මල්දම

20. "අමර ගියා දිව්‍ය ලෝකේ" නාට්‍ය පෙළෙහි නාට්‍ය අධ්‍යක්ෂවරයා වන්නේ

(1) පාලිත ලොකු පෝතාගම (2) ජයලත් මනෝරත්න

(3) සෝමලතා සුබසිංහ (4) කෞශල්‍යා ප්‍රනාන්දු

20 X 2 (ල. 40)

## II කොටස

උපදෙස්:

**දෙවන කොටසෙහි පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවිය යුතු මුළු සංඛ්‍යාව පහකි.**

01. (1) "පුංචි අපට දූන් තේරෙයි" නාට්‍යයේ අධ්‍යක්ෂවරිය නම් කරන්න. (ලකුණු 02)

(2) ඇයගේ වෙනත් නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(3) "පුංචි අපට දූන් තේරෙයි" නාට්‍යයේ චරිත දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(4) "පුංචි අපට දූන් තේරෙයි" නාට්‍යයේ කම්මැලිකමින් සිටියේ කවු ද? (ලකුණු 02)

(5) "පුංචි අපට දූන් තේරෙයි" නාට්‍යයේ කම්මැලියන්ගේ කම්මැලිකම නැතිකළේ කවු ද? (ලකුණු 02)

(6) "පුංචි අපට දූන් තේරෙයි" නාට්‍යයෙන් ඔබට ගත හැකි ආදර්ශය කුමක් ද? (ලකුණු 02)

02. (1) කතාන්දරයක ඇති විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(2) නාට්‍ය පිටපතක ඇති ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

(3) ඔබ දන්නා කතන්දරයක් ලියා දක්වන්න. (ලකුණු 05)

03. (1) අභිනය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 03)

(2) අභිනයේ කොටස් නම් කරන්න. (ලකුණු 04)

(3) ඔබ වඩාත් කැමති අභිනය නම් කර එයට උදාහරණයක් දක්වන්න. (ලකුණු 05)

04. (1) ''නාට්‍යෝපකරණ'' යන්න අර්ථ දක්වන්න. (ලකුණු 03)

(2) ඔබ දන්නා නාට්‍යෝපකරණ හතරක් නම් කරන්න. (ලකුණු 04)

(3) සාමාන්‍ය ජීවිතයේ දී භාවිතා කරනු ලබන භාණ්ඩ නාට්‍යයේ දී රංග භාණ්ඩ ලෙස යොදා ගත හැකි අවස්ථාවන් දක්වන්න. (ලකුණු 05)

05. (1) ''ජන ක්‍රීඩාවක්'' යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 03)

(2) ඔබ දන්නා ජන ක්‍රීඩා හතරක් ලියන්න. (ලකුණු 04)

(3) ඔබ කැමති ජන ක්‍රීඩාවකින් නාට්‍යයක රංගයක් හෝ චරිතයක් සාදා ගන්නා අයුරු දක්වන්න. (ලකුණු 05)

06. (1) ජන කතා යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 03)

(2) ජන කතා බෙදී ඇති ක්ෂේත්‍ර හතරක් නම් කරන්න. (ලකුණු 04)

(3) ජන කතා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යෙදීමෙන් ජීවිතයට ලබාගත හැකි දේවල් පහක් ලියන්න. (ලකුණු 05)

07. පහත දැක්වෙන අවස්ථාවකින් එකක් පාදක කරගෙන කෙටි නාට්‍යකට සුදුසු පෙළ රචනයක් ලියන්න.

(1) කුඹුරක් මැද සිදෙමින් පවතින දියවළක් - මාළු දෙදෙනෙක්- කක්කුට්ටෙක් දියවල දෙස බලා සිටින කොකෙක්.

(2) කැළයක අඹ ගසක් - අත්තක කූඩුවක් - කුරුළු පැටවුන් දොරට වඩින දවසක් - ගසයට තුඹසක් - ඉන් එළියට එන නයෙක් - කුරුළු මවගේ හැඬීමක් - තුඹස අසලට එන මුගටියෙක්.

(3) පූසෙක්, කේක් කෑල්ලක් - බල්ලෙක්, කේක් කෑල්ලට මාන බලන කපුටෙක්, රැවටීමක්.

(4) මඩ වළක නෙලුමක් - මී මැස්සෙක් - නිල මැස්සෙක් - සමනලයෙක් - මල් නෙලන ළමයෙක්

(i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීම. (ලකුණු 04)

(ii) සංවාද සහ රංග විධාන සහිතව පෙළ රචනා කිරීම. (ලකුණු 08)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | නාට්‍ය හා රංග කලාව ප්‍රායෝගික පරීක්ෂණය |

01. පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල)
මෙහිදී අදාළ පෙළෙහි (පුංචි අපට දුන් තේරෙයි)
ශිෂ්‍යයාගේ අභිමතය පරිදි දෙබසක් තෝරා ගෙන කියවීමට සලස්වන්න.

නිර්ණායක:-

| | | |
|---|---|---|
| 1. | කටහඬ උච්චාරණය | ල. 10 |
| 2. | චරිතයට ගැලපීම | ල. 05 |
| 3. | භාවාත්මක නිරූපණය | ල. 05 |
| 4. | ශාරීරික ප්‍රකාශනය | ල. 05 |
| | | ල. 25 |

02. චරිත අනුකරණය කිරීම. (ගුරුවරයා විසින් දෙනු ලබන චරිත වලින් ශිෂ්‍යයාට තෝරා ගැනීමට ඉඩ සලස්වන්න.)

නිර්ණායක:-

| | | |
|---|---|---|
| 1. | චරිතයට ගැලපීම | ල. 05 |
| 2. | රූපණය | ල. 10 |
| 3. | සංවාද භාවිතය | ල. 05 |
| 4. | ශාරීරික ප්‍රකාශනය | ල. 05 |
| | | ල. 25 |

03. නාට්‍ය ගීතයක් හෝ ළමා ගීතයක් ගායනය කරමින් රඟ දැක්වීම.

නිර්ණායක:-

| | | |
|---|---|---|
| 1. | නිවැරදි නාද මාලාව | ල. 05 |
| 2. | භාවාත්මක ගැයීම | ල. 05 |
| 3. | රිද්මයානුකූල බව | ල. 05 |
| 4. | ශාරීරික ප්‍රකාශනය | ල. 10 |
| | | ල. 25 |

04. කථා පුවතක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම

නිර්ණායක:-

| | | |
|---|---|---|
| 1. | මතකයෙන් කථාව කියවීම | ල. 10 |
| 2. | හඬ පාලනය | ල. 05 |
| 3. | භාවයන් ඉස්මතු කිරීම | ල. 05 |
| 4. | ශාරීරික ප්‍රකාශනය | ල. 05 |
| | | ල. 25 |

(ල. 100)